# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2278/02 - 2022 මැයි මස 02 වැනි සඳුදා - 2022.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක : 82

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත (සංශෝධිත)**

20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 20(5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම සැපයුම්කරුවෙකු, නිෂ්පාදකයෙකු, සාදන්නෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් පහත දක්වා ඇති දේශීය සහල් වර්ග එහි සඳහන් කර ඇති උපරිම සිල්ලර මිලට වඩා වැඩියෙන් වෙළෙඳාම් කිරීම, සැපයීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ වෙළෙඳාම් කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *වර්ගය* | *උපරිම සිල්ලර මිල* |
|---|---|
| සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද - දේශීය<br>(මොට්ටෙයිකරුප්පන් සහ අට්ටික්කාරි හැර) | කිලෝ ග්‍රෑම් 1ක් රුපියල් 220 |
| සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද - දේශීය<br>(සුදුරු සම්බා හැර) | කිලෝ ග්‍රෑම් 1ක් රුපියල් 230 |
| කීරි සම්බා - දේශීය | කිලෝ ග්‍රෑම් 1ක් රුපියල් 260 |

වී අලෙවි මණ්ඩලය විසින් සහන මිලට වෙළෙඳපොළ වෙත නිකුත් කරනු ලබන සහල් සඳහා මෙම නියෝගය අදාළ නොවේ.

මෙම නියෝගය 2022 මැයි මස 02 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

විශ්‍රාමික මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක,
සභාපති.

2022 මැයි මස 02 වැනි දින,
කොළඹ දී ය.

EOG 05 - 0230

1A - PG 5829 — 106 (2022/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*